# සේවක අර්ථසාධක අරමුදලින් 30% පූර්ව ප්‍රතිලාභ ගෙවීම සඳහා මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ අයදුම්පත

1. මුලකුරු සමඟ නම :-..............................................................................................

2. මුලකුරු වලින් හැඳින්වෙන නම:-...............................................................................

3. ලිපිනය :-..................................................................................................................

4. ජාතික හැඳුනුම්පත් අංකය:- | | | | | | | | | | |

5. දුරකතන අංකය:- | | | | | | | | | | |

6. ඔබ දැනට සේවක අර්ථසාධක අරමුදලට දායක වන සාමාජිකයෙක්ද ? ඔව් / නැත

| | සේවා යෝජක අංකය | අක්ෂරය | සාමාජික අංකය |
|---|---|---|---|
| වර්තමාන සේවක අර්ථසාධක අරමුදල් අංකය | | | |
| මීට පෙර සේවය කරන ලද ආයතන වල සේවක අර්ථසාධක අරමුදල් අංක | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

7. ප්‍රතිලාභ ඉල්ලුම් කිරීමේ අරමුණ (නිවාස කාර්යය ද ? වෛද්‍ය ප්‍රතිකාර කාර්යය ද ? යන වග) :-

..............................................................................................................................

8. ඔබ මීට පෙර සේවක අර්ථසාධක අරමුදල ඇපයට තබා නිවාස ණයක් ලබාගෙන තිබේද ? ඔව් / නැත

ඉහත සඳහන් කළ තොරතුරු සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි.

.................................... ............................................

දිනය සාමාජිකයාගේ අත්සන

මෙම අයදුම්පත නිවැරදිව සම්පූර්ණ කර "කම්කරු කොමසාරිස්, සේවක අර්ථසාධක අරමුදල, කම්කරු දෙපාර්තමේන්තුව, කොළඹ 05" යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් ලැබීමට සලස්වන්න.
කවරයේ වම් පස ඉහල කෙලවරේ "30% පූර්ව ප්‍රතිලාභ ගෙවීම" යනුවෙන් සඳහන් කළ යුතුය.
අයදුම්පතෙහි සඳහන් තොරතුරු පරීක්ෂා කොට ඉන් අනතුරුව මූලික සුදුසුකම් සපුරා ඇති සාමාජිකයන් සඳහා පමණක් ප්‍රතිලාභ අයදුම්පත් සහ උපදෙස් පත්‍රිකා නිකුත් කරනු ලැබේ.

වැඩි විස්තර සඳහා ප්‍රතිලාභ කාර්යාලය- (011 2368917,011 2368252,011 2368349, 011 2368350,011 2368351)

## කම්කරු අමාත්‍යාංශය
## කම්කරු දෙපාර්තමේන්තුව

# සේවක අර්ථසාධක අරමුදලින් 30% පූර්ව ප්‍රතිලාභ ගෙවීම

2012 අංක 02 දරන පනතින් සංශෝධනය කළ 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත අනුව
දැනට සේවයේ නියුක්තව සිටින සේවක අර්ථසාධක අරමුදලේ සෑම සාමාජිකයකු සඳහාම නිවාස/ වෛද්‍ය
ප්‍රතිකාර කාර්යයන් සඳහා ඔබගේ
සේවක අර්ථසාධක අරමුදල් ගිණුමේ බැරට ඇති මුදලින් සියයට තිහක් නොඉක්මවන ප්‍රතිශතයක්
මුදාහැරීම 2015 මැයි මස 27 වන දින සිට ආරම්භ කිරීමට නියමිතය.

<u>මෙම ප්‍රතිලාභ අයදුම් කිරීම සඳහා පහත මූලික සුදුසුකම් සපුරා තිබීම අනිවාර්යය වේ.</u>

i. දැනට සේවයේ නියුක්තව සිටීම
ii. වසර දහයකට නොඅඩු කාලයක් සඳහා අරමුදලට දායක මුදල් ගෙවා තිබීම
iii. ඔබගේ සේවක අර්ථසාධක අරමුදල් ගිණුමේ රුපියල් ලක්ෂ තුනකට නොඅඩු මුදලක් තිබීම (එනම්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් විගණනය කරන ලද සාමාජික ගිණුම් ශේෂය රු. ලක්ෂ තුනකට නොඅඩු විය යුතුය.)

<u>"නිවාස" කාර්යය යන්නට, සාමාජිකයා විසින්</u>

i. සාමාජිකයාට අයත් ඉඩමක නිවසක් ඉදිකිරීම
ii. නිවාසයක් ඉදිකිරීම සඳහා ඉඩමක් මිල දී ගැනීම
iii. නිවාස දේපළක් මිල දී ගැනීම
iv. නිවාස දේපළක් මත ඇති උකසක් බේරුම් කිරීම හෝ
v. අනුමත බැංකුවකින් ලබාගත් නිවාස ණයක ඉතිරි මුදල බේරුම් කිරීම ඇතුලත් වේ.

<u>"වෛද්‍ය ප්‍රතිකාර" යන්නට</u>

i. හෘදය සැත්කම
ii. බයිපාස් සැත්කම
iii. සැත්කම ඇතුළුව පිළිකා සඳහා ප්‍රතිකාර
iv. වකුගඩු බද්ධ කිරීම් හෝ සැත්කම්
v. සිසේරියන් සැත්කම හෝ
vi. අනතුරක් සිදුවීම හේතු කොටගෙන දින දාහතරකට නොඅඩු කාලයක් රෝහල් ගතව සිටීම, ඇතුලත් වන අතර සාමාජිකයා,කලත්‍රයා සහ දරුවන් වෙනුවෙන් ප්‍රතිලාභ ඉල්ලුම් කල හැකිය.

ඉහත කාර්යය වලින් යම් කාර්යයක් සඳහා ලබා ගත හැකි උපරිම මුදල් ප්‍රමාණය රුපියල් මිලියන දෙකක් (රු.2,000,000.00) නොඉක්මවිය යුතුය.

30% පූර්ව ප්‍රතිලාභ ගෙවීමේ මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා වන අයදුම්පතෙහි ආකෘතියක් මේ සමඟ දක්වා ඇත. ඒ අනුව සකස් කරන ලද අයදුම්පත නිවැරදිව සම්පූර්ණ කර "කම්කරු කොමසාරිස්, සේවක අර්ථසාධක අරමුදල, කම්කරු දෙපාර්තමේන්තුව, කොළඹ 05" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් ලැබීමට සලස්වන්න.
කවරයේ වම් පස ඉහල කෙලවරේ "30% පූර්ව ප්‍රතිලාභ ගෙවීම" යනුවෙන් සඳහන් කළ යුතුය.
අයදුම්පතෙහි සඳහන් තොරතුරු පරීක්ෂා කොට ඉන් අනතුරුව මූලික සුදුසුකම් සපුරා ඇති සාමාජිකයන් සඳහා පමණක් ප්‍රතිලාභ අයදුම්පත් සහ උපදෙස් පත්‍රිකා නිකුත් කරනු ලැබේ.

වැඩි විස්තර සඳහා : ප්‍රධාන කාර්යාලය- (011 2368917,011 2368252,011 2368349. 011 2368350.011 2368351)

ලේකම්
කම්කරු අමාත්‍යාංශය
කොළඹ 05